---

කල්මුනේ මහා නගර සභාව

අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 18 දින විගණන සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 ජනවාරි 05 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 අගෝස්තු 14 දින සභාවේ නගරාධිපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කල්මුනේ මහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට කල්මුනේ මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු

---

(අ) ස්ථාවර තැන්පතු රු.650,817 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට අතැති පොදු ගබඩා තොගයේ අගය භෞතිකව හරිවැරදි බැලූ අගයට දක්වනු වෙනුවට පොත් අගය මත දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශයන්හි එකතුව රු.136,194,774 කට දක්වා ඇති ජංගම නොවන වත්කම් වල වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂනයක් සිදුකර නොතිබුණි.

(ඇ) විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශයන්හි රු. 35,790 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශයන්හි ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.8,070,478 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.3,557,481 ක් විය.

### 2.2 අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) මැතිවරණ කොමසාරිස්වරයාගේ අංක එල්ජීඊ/2011/4(3) හා 2011 අගෝස්තු 06 දිනැති චක්‍රෙල්ඛයේ විධිවිධාන වලට පටහැනිව සභා මන්ත්‍රීවරුන් වෙත රු.224,778 ක් වටිනා වීදි ලාම්පු නිකුත් කර තිබුණි.

(ආ) මහනගර සභාව විසින් පරිසරය පිළිබඳව අංක 1534/18 හා 2008 පෙබරවාරි 01 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව රු.12,544 ක් වූ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i. | වරිපනම් හා බදු | 10,153 | 10,223 | 80,492 |
| ii. | බදු කුළී | 13,578 | 11,514 | 29,253 |

| | | | | |
|---|---|---|---|---|
| iii. | බලපත්‍ර ගාස්තු | 2,030 | 1,819 | - |
| iv. | වෙනත් ආදායම් | 13,982 | 1,072 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ වෙනත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,363,017 |
| (ii) | මුද්දර ගාස්තු | 9,677,290 |

2.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) තක්සේරු බදු

i. දිගු කාලයක් තිස්සේ පවතින රු.80,492,372 ක් වූ හිඟ තක්සේරු බදු අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

ii. හිඟ මුදල් අයකිරිමක් නොකොට තක්සේරු බදු වලට අදාල පරිගණක පද්ධතියේ වරිපනම් ගෙවන්නන්ගේ නම් ගණනාවක් වෙනස් කර තිබුණි.

(ආ) පොදු වෙළඳසැල කුලී

i. පොදු වෙළඳ පලවලට අදාලව දිගු කාලයක් තිස්සේ පවතින රු.9,183,603 ක් වූ හිඟ කුලී අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

ii. ගවමස් වෙළඳ පලවලට අදාලව දිගු කාලයක් තිස්සේ පවතින රු.3,961,767 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

iii. මාළු වෙළඳ පලවලට අදාලව දිගු කාලයක් තිස්සේ පවතින රු. 13,695,005 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

iv. පාපැදි සඳහා වූ රථගාල වෙනුවෙන් දිගු කාලයක් තිස්සේ හිඟව පවතින රු.2,412,863 ක් වූ බදුකුලී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ණය සහ අත්තිකාරම්

------------------------

i. කාර්ය මණ්ඩලයට සහ වෙනත් ආයතනයන්ට ලබාදුන් එකතුව රු.33,404,330 ක්වූ අත්තිකාරම් දිගු කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

ii. විශ්‍රාමික මියගිය සහ ස්ථාන මාරු ලද නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.12,161,423 ක් වූ ණය ශේෂයන් වර්ෂ ගණනාවක සිට අය නොකර පැවතුණි.

iii. ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.9,944,208 ක් දිගු කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

සභාවේ නිල වාහනය නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙනුවෙන් වෙන්කර තිබුණු බැවින් කොමසාරිස්වරයාගේ ප්‍රයෝජනය සඳහා වාහනයක් කුලියට ගෙන ඒ සඳහා රු.44,800 ක් ගෙවා තිබුණි.

## 3. පද්ධති සහ පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගබඩා පාලනය
(ඇ) ආදායම් /රැස්කිරිම
(ඈ) අත්තිකාරම් අයකිරිම
(ඉ) ගිණුම්කරණය
(ඊ) වාහන නඩත්තුව
(උ) තැන්පතු
(ඌ) අයවැය පාලනය